**කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යකරණය ව්‍යාපෘතිය -2021**

කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ **කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යකරණය ව්‍යාපෘතියේ** 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2020 අප්‍රේල් 02 දිනැති අංක පීඒඩී 3852 දරන ලෝක බැංකු වාර්තාවේ 52 වගන්තිය සහ 2021 අප්‍රේල් 22 දිනැති අංක පීඒඩී 4442 දරන ලෝක බැංකු වාර්තාවේ 71 වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (ව්‍යා.ක.ඒ.) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ තර්ජන වැළැක්වීම, හඳුනාගැනීම සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍යය සූදානම සඳහා ජාතික පද්ධති ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 41,717.45 කට සමාන එ.ජ.ඩො. මිලියන 209.11 ක් වූ අතර ඉන් රු. මිලියන 12,271.25 කට සමාන එ.ජ.ඩො. මිලියන 61.51 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණු අතර රු.මිලියන 29,446.20 කට සමාන එ.ජ.ඩො. මිලියන 147.60 ක මුදලක් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2020 අප්‍රේල් 04 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහ, ඒකාබද්ධ ලැබීම් සහ ගෙවීම් සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට අරමුදල් නියෝජිතායතනය විසින් අය කරන ලද රු.මිලියන 242.6 ක ණය පොලිය සහ රු.මිලියන 2.7 ක කැපකිරීම් ගාස්තු ගිණුම්ගත කර නොතිබුණු අතර ණය ගිවිසුම් අංක.9085 ට අදාළ ණය නියෝජිතායතනය විසින් 2021 නොවැම්බර් 15 දිනට අය කරන ලද එ.ජ.ඩො. 39,695.03 කට සමාන රු.මිලියන 7.99 ක්ද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 253.29 | එකඟ වන බව. | ඉදිරි වසර සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවල මෙම දෝෂය නිවැරදි කළ යුතුය. |
| (ආ) | භාණ්ඩ ලැබීම් ඇණවුම්, තොග සහතික, වැඩ වාර්තා, ගෙවීම් සහතික සහ ප්‍රසම්පාදන තීරණ, රු. මිලියන 32.3 කට අදාළ ලදුපත් සහ එකතුව රු. මිලියන 36.0 ක් වූ ගෙවීම් 21 කට අදාළ වවුචර ආදී ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.මිලියන 161.5 ක ගෙවීම් සතුටුදායක ලෙස තහවුරු කළ නොහැකි විය. | 229.8 | එකඟ වන බව. | මෙම වියදම් සනාථ කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20(1) සහ 20(2) වගන්ති. | විධිමත් බදු ඉන්වොයිසියක් ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 16 කදී රු.මිලියන 8.3 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | පනතට අනුව විධිමත් බදු ඉන්වොයිසියක් මත එකතු කළ අගය මත බදු ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2021 අංක 09 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 8(1) වගන්තිය. | 2020 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොවිඩ්-19 වසංගත තත්වය සඳහා යොදාගනු ලබන වෛද්‍ය උපකරණ එකතු කළ අගය මත බද්දෙන් (VAT) නිදහස් කර තිබුණි. කෙසේ වෙතත්, එම විධිවිධානවලට පටහැනිව, 2020 සහ 2021 වසරවල සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා සැපයුම්කරුවන් 51 දෙනෙකු වෙත එකතුකළ අගය මත බදු ලෙස රු.මිලියන 96.3 ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම බදු මුදල් අයකරගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(5) | වැඩ නිම කිරීමෙන් පසු දින 10 ක් ඇතුළත තත්කාර්ය අතුරු අග්‍රිම පියවිය යුතුය. කෙසේ වෙතත්, අවස්ථා 33 කදී නිකුත් කරන ලද රු.මිලියන 2.5 ක තත්කාර්ය අතුරු අග්‍රිම 2021 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක. 1/2019 හි 9.3 ඡේදය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛයට අනුව පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් චක්‍රලේඛයට අනුව පැවැත්විය යුතුය. |
| (ඉ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2007 අගෝස්තු 07 දිනැති අංක. MOFP/ERD/2007/2 දරන චක්‍රලේඛය. | ව්‍යාපෘතියේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසානවී මාස දෙකක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආසන්න වශයෙන් මාස 06 ක ප්‍රමාදයකින් පසු 2022 අගෝස්තු 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. 2022 සඳහා වන මූල්‍ය ප්‍රකාශය නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) සමඟ ඇති කරගත් ගිවිසුම්වලට අනුව, 2020 වර්ෂයේ අවස්ථා 03 කදී එ.ජ.ඩො. මිලියන 29.97 ට සමාන රු.මිලියන 5,550.4 ක් සහ 2021 වර්ෂයේදී එ.ජ.ඩො. මිලියන 2.66 කට සමාන රු.මිලියන 532.94 ක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණන් කරනු ලැබේ. | | |
| (i) මූල්‍ය සීමාව තීරණය කිරීම සඳහා ලබාගත් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අ.ම.ප. අංක. 20/0694/201/016 මගින් 2020.04.01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව. | මෙම මිලදී ගැනීම් සඳහා අදාළ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) 2020 සහ 2021 වර්ෂවලදී එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් දේශීය සැපයුම්කරුවන්ගෙන් සමස්ථ පිරිවැය රු. මිලියන 4,357.99 ක් වූ වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් අයිතම 90 කින් ඒකක 17,756,669 ක් මිලදී ගෙන වෛද්‍ය සැපයුම් අංශය වෙත භාර දී තිබුණි. වෛද්‍ය සැපයුම් අංශයට ලැබී තිබුණු සියලුම වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් පරිත්‍යාග ලෙස සලකා තොග පොත්වලට ගෙන තිබුණු අතර එබැවින් කිසිදු වටිනාකමක් නොමැතිව වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව මෙම ගැටලුව විසඳීමට වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂ සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදී ඇති බව. | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (iii) ඉහත (ii) ඡේදයේ සඳහන් වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් අතරින්, මුළු පිරිවැය රු.මිලියන 2,565.90 ක් වූ ඒකක 9,619,971 ක් සහ (iv) ඡේදයේ සඳහන් වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම්වලින් එ.ජ.ඩො. මිලියන 1.55 ක් වූ ඒකක 397,798 ක් වෛද්‍ය සැපයුම් අංශය විසින් පරිත්‍යාග ලෙස පිළිගෙන තිබුණි. එම නිසා ඒවා නිසි පරිදි පරීක්ෂා | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම වියදම තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කර භාරගෙන නොතිබුණු අතර එම නිසා ඇණවුම් කළ ප්‍රමිතියට අනුව මෙම වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් සැපයූ බවට තහවුරු නොවුණි. | | |
| | (iv) | 2021 දෙසැම්බර් 16 දින එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම් වාර්තාවට අනුව, අත්තිකාරම් වශයෙන් ගෙවන ලද එ.ජ.ඩො. මිලියන 32.64 න් එ.ජ.ඩො. මිලියන 2.04 ක් ඉතිරිව තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි මුදල් 2022 ඔක්තෝබර් 18 දින දක්වා අයවී නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කර ඉතිරි මුදල් කඩිනමින් ලබා ගත යුතුය. |
| (ආ) | | ව්‍යාපෘති අරමුදල් වියදම් කිරීමෙන් එ.ජ.ඩො. මිලියන 18.35 ක උපරිම මූල්‍ය සීමාවක් තුළ වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා 2021 දී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS) සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුමට අනුව, සමාලෝචිත වර්ෂය තුළ එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය අත්තිකාරම් වශයෙන් ඩොලර් මිලියන 18.35 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (i) | මූල්‍ය සීමාව තීරණය කළ පදනම පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අ.ම.ප. අංක. 20/0694/201/016 මගින් 2020.04.01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව. | මෙම මිලදී ගැනීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගත යුතු අතර විගණනය සඳහා අදාළ අනුමැතිය ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) | සමාලෝචිත වර්ෂය තුළ එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය විසින් මුළු පිරිවැය රු. මිලියන 777.67 ක වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් ලබාදී තිබුණි. කෙසේ වෙතත්, ඒවායේ ඒකක පිරිවැය එ.ජ.ඩො. වලින් සඳහන් කර නොතිබුණි. එබැවින් එකඟ වූ මූල්‍ය සීමාවන් තුළ ලැබිය යුතු උපකරණ ප්‍රමාණය ලබා දුන්නේ දැයි පරීක්ෂා කිරීමට නොහැකි විය. | දේශීය සැපයුම සඳහා එ.ජ.ඩො. වලින් ඒකක මිල ඉදිරිපත් කිරීමට එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය එකඟ වී ඇති බව. | මෙම තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ එච්ඊ 440 වර්ගයේ CRRT යන්ත්‍ර 12 ක් එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය විසින් ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත ලබාදී තිබුණි. එම යන්ත්‍ර 12 න් යන්ත්‍ර 02 ක් එම යන්ත්‍ර 02 ඉතා හදිසි බව සඳහන් කරමින් එකක් එ.ජ.ඩො. 17,667.84 කට සමාන රු. මිලියන 3.52 ක මුදලකට දින හතක් ඇතුළත ලබාගෙන තිබුණි. ඉතිරි යන්ත්‍ර 10 ය එ.ජ.ඩො. 14,891.47 කට සමාන රු. මිලියන 2.97 ක් බැගින් දින 30 ක් ඇතුළත ලබාගෙන තිබුණි. ඒ අනුව ඉතා හදිසි අවශ්‍යතාවයක් ලෙස සපයා ගත් යන්ත්‍ර 02 ක සඳහා එ.ජ.ඩො. 5,552.74 කට සමාන රු. මිලියන 1.10 ක් වැඩිපුර ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම යන්ත්‍ර 02 ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට ලැබුණු දින සිට දින 30 කට පසුව අදාළ රෝහල් වෙත බෙදා දී ඇති හෙයින් එම යන්ත්‍ර 02 සඳහා එවැනි හදිසි අවශ්‍යතාවයක් නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර එම යන්ත්‍ර 02 ඉතිරි යන්ත්‍ර 10 මිලදී ගත් මිලටම මිලදී ගත හැකිව තිබුණි. තවද, ඉතා හදිසි කටයුත්තක් ලෙස ඉහත ප්‍රසම්පාදනය තීරණය කරන ලද්දේ කවුරුන්ද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | හදිසි තත්ත්වය හේතුවෙන් යන්ත්‍ර දෙකක් කණ්ඩන ප්‍රසම්පාදන පදනම (Split procurement) මත මූලිකව මිලදී ගැනීමට එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල තීරණය කර තිබුණු බව හා අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගෙන ඉදිරියේදී පිළිතුරු ලබා දෙන බව. | මේ සම්බන්ධයෙන් සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුය. |
| (iv) | එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය විසින් 2021 මැයි සහ අගෝස්තු කාලය තුළ සපයන ලද සමස්ථ පිරිවැය රු. මිලියන 364.65 ක් වූ Yuwell ඔක්සිජන් සාන්ද්‍ර (Yuwell Oxygen Concentrators) 2,100 න්, Yuwell ඔක්සිජන් සාන්ද්‍ර 462 ක් 2022 ජුනි 29 වන විට බෙදා හැර නොතිබුණු අතර ඒවා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ ගබඩා කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම උපකරණ අවශ්‍යතා හඳුනාගෙන බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |
| (v) | ගිවිසුමට අනුව, වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය සැපයුම් අමාත්‍යාංශයේ ගබඩාවට ලබාදීම දක්වා සියලු වියදම් එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය විසින් දැරිය යුතු අතර භාණ්ඩ ආනයනයේදී දැරිය යුතු රේගු ගාස්තු ඇතුළු බදු නිදහස් කිරීමට දෙපාර්ශවය එකඟ වී තිබුණි. කෙසේ | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මේ සම්බන්ධයෙන් සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුය. |

වෙතත්, ව්‍යාපෘතිය විසින් 2021 වර්ෂය තුළ සපයන ලද වෛද්‍ය උපකරණ සඳහා රු. මිලියන 45.78 ක රේගු ගාස්තු සහ රු. 180,178 ක ගුවන් ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ, වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා ව්‍යාපෘති අරමුදල්වලින් එ.ජ.ඩො. මිලියන 4.11 කට සමාන රු. මිලියන 824.26 ක මුදලක් අදාළ සැපයුම්කරුවන් වෙත සෘජුවම ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | මෙම සෘජු ගෙවීම් සඳහා ගිවිසුම්, අනුමැතිය, ප්‍රසම්පාදන ක්‍රමවේදය සහ අදාළ ලියකියවිලි මෙන්ම මුදල් ලැබීම් සඳහා වූ රිසිට්පත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මෙම මිලදී ගැනීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගත යුතු අතර විගණන කටයුතු සඳහා අදාළ අනුමැතිය ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | අවස්ථා 02 කදී, පුද්ගලික සමාගම් 02 කින් මිලදී ගත් රු මිලියන 192.05 ක පිරිවැය වූ වෛද්‍ය සැපයුම් සඳහා නිකුත් කරන ලද භාණ්ඩ ලැබීමේ පත්‍ර (GRNs) 05 ක සැපයුම්කරුගේ නම ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) දක්වා තිබුණි. එයට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | මේ පිළිබඳව සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුයි. |
| (iii) | අවස්ථා 03 කදී, පෞද්ගලික සමාගම් 03 කින් රු. මිලියන 243.08 ක මුදලකට මිලදී ගත් වෛද්‍ය සැපයුම් එකඟ වූ දිනට ලබාදී නොතිබුණි. කෙසේ වෙතත්, ඇණවුම්/ප්‍රසම්පාදන කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. | එකඟ වන බව. සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |
| (iv) | 2021 ඔක්තෝබර් 04 දිනැති අංක. 1271 (iii) දරන වට්නාකම රු. මිලියන 53.89 ක් වූ ගෙවීම් වවුචරයට අදාළ විකුණුම් ඉන්වොයිසිය සහ භාණ්ඩ ලැබීම් පත්‍රය සහ 2021 ඔක්තෝබර් 04 දිනැති අංක 1271 (vi) දරන වටිනාකම රු. මිලියන 53.4 ක් වූ ගෙවීම් වවුචරයට අදාළ භාණ්ඩ ලැබීමේ පත්‍රය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වන බව. අවශ්‍ය ලියකියවිලි හැකි ඉක්මනින් ඉදිරිපත් කරනු ලබන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (v) | 2021 ඔක්තෝබර් 04 දිනැති අංක 1271 (viii) දරන රු. මිලියන 206.25 ක් වූ ගෙවීම් වවුචරයට අදාළ විකුණුම් ඉන්වොයිසියේ මුල් පිටපත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වන බව. අවශ්‍ය ලියකියවිලි හැකි ඉක්මනින් ඉදිරිපත් කරනු ලබන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 29 කදී වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 276.74 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ලදුපත්වලට අනුව මෙම වෛද්‍ය උපකරණ පරිත්‍යාග ලෙස ලැබී ඇති බව නිරීක්ෂණය විය. මෙම භාණ්ඩ නිසි පරීක්ෂාවකින් තොරව භාරගෙන ඇති බවද නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | -එම- |
| (ඉ) | නියමිත වේලාවට සැපයීම ප්‍රමාද වූ සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 68.56 ක වියදමින් මිලදී ගත් වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් සහ ටෙන්ඩර් කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා පසුව වාර්තා කිරීමට නියමිත බව. | මේ සම්බන්ධයෙන් සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | 2021 මාර්තු 29 දිනට අයකළ ප්‍රමාද ගාස්තු රු. 195,254 ක් වුවද, 2021 නොවැම්බර් 10 දිනට ආපසු ලබාදුන් මුදල රු. 402,065 ක් විය. ඒ අනුව වැඩිපුර ගෙවූ මුදල රු. 206,811 ක් වූ අතර ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීමට හේතුව සහ ඒ සඳහා ලැබුණු අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සොයා බලා පසුව වාර්තා කිරීමට නියමිත බව. | -එම- |
| (උ) | පසුගිය වසර තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 02 කට ලබාදීමට රු. මිලියන 18.13 ක් වැයකර මිලදී ගත් කැබ් රථ දෙකක් 2022 ජූලි 28 වන විටත් එම කාර්යාල වෙත ලබාදී නොතිබුණි. | එකඟ වන බව. කැබ් රථ දෙකක් අදාළ කාර්යාල වෙත ලබාදීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට උපදෙස් ලබාදී ඇති බව. | මෙම වාහන 02 නියමිත කාර්යාල වෙත කඩිනමින් භාර දිය යුතුය. |
| (ඌ) | පසුගිය වසරේ රු. මිලියන 239.48 ක පිරිවැයකට මිලදී ගත් යතුරුපැදි 805 ක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත ලබාදී තිබුණි. කෙසේ වෙතත්, එම නිලධාරීන් සමඟ ලිඛිත ගිවිසුම්වලට එළඹ තිබුණේද යන්න සහ එම නිලධාරීන්ට මීට පෙර යතුරුපැදි ලබාදී තිබේද යන්න තහවුරු කිරීමේ සාක්ෂි 2022 සැප්තැම්බර් 23 වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වන බව. | දෙපාර්ශවය අතර ගිවිසුම් ඇතිකර ගත යුතුය. |